# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2111/53 – 2019 පෙබරවාරි 22 වැනි සිකුරාදා – 2019.02.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යටිගහ පත්තුව සුළු කොට්ඨාසයේ, හීදියවල (කසි 510242) කලාප 01 ගමේ පිහිටි, ගම්පහ කොට්ඨාස භාර මැනුම් අධිකාරී විසින් 2010.05.10 වැනි දින පිළියෙල කරන ලද අංක ගම්/මීරි/2009/369 දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 1 හා 3 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.9007ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් දෙකට (02) මායිම්:

01. **කැබලි අංක 1 – රුක්මල්අගාරවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1108ක් පමණ**

උතුරට: අංක 510242 දරන කඩඉම් සිතියමේ කලාප 1හි කැබලි අංක 159; නැගෙනහිරට: කැබලි අංක 2; දකුණට: කැබලි අංක 2, 3 සහ ගස්පේ ගම; බටහිරට: ගස්පේ ගම.

02. **කැබලි අංක 3 – රුක්මල්අගාරවත්ත – ප්‍රමාණය: හෙක්. 0.7899ක් පමණ**

උතුරට: කැබලි අංක 2; නැගෙනහිරට: කැබලි අංක 2 සහ අංක 510242 දරන කඩඉම් සිතියමේ කලාප 1හි කැබලි අංක 30; දකුණට: අංක 510242 දරන කඩඉම් සිතියමේ කලාප 1හි කැබලි අංක 30 සහ 36; බටහිරට: අංක 510242 දරන කඩඉම් සිතියමේ කලාප 1හි කැබලි අංක 36, 32, ගස්පේ ගම සහ කැබලි අංක 1.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

යොමු අංකය: එල්ඩී/05/2009/ඒ/207.
2018 අගෝස්තු මස 09 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 - 471


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*